# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,919 — 1970 අගෝස්තු 14 වැනි සිකුරාද — 1970.8.14**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 601 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | 601 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 603 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 604 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 609 |
| "සුරාබද්ධ ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | 612 |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 234**

අංකය : ඩී. 277/ආර්පීසී.

**යුද හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම් සඳහන් නිලධාරියා 1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට යුද හමුදා ස්ථිර බලහමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

කපිතාන් (තාවකාලික මේජර්) ජෝෂප් පිලිප් ඇන්ඩෘ ප්‍රනාන්දු, ලං. වි. යා. ඉ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 ජූලි මස 29 දින,
කොළඹදීය.

8-422

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 235**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය:—

අංකය: ජේඒඒ. 7/48.

බී. ආර්. සිල්වා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 ජූලි මස 31 වැනි දින සිට බලපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 58508 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක පිස්කල් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය: ජේඑම්/ජී. 47/66.

ඩී. විමලරත්න මහතා 1970 ජූලි මස 30 දින සිට 1970 අගෝස්තු මස 3 දින දක්වා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් ධුරය ස්ථිර වශයෙන් උසුලන අය නිවාඩු පිට සිටින අතර එහි වැඩ බැලීමට.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ආර්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

අංකය : ජේඑම්/ජී. 40/66.

රී. ඒ. විජේකුලසූරිය මහතා 1970 ජූලි මස 27 වන දින සිට 1970 අගෝස්තු මස 23 දින දක්වා අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66.

ඒ. එස්. විජේතුංග මහතා 1970 ජූලි මස 27 වැනි දින සිට නැවත නියෝගයක් කරන තෙක් හෝ කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66.

වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා 1970 ජූලි මස 27 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 24/59.

එෆ්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. තියාගරාජා මහතා 1970 ජූලි 31 දින සිට 1970 අගෝස්තු 5 දින දක්වා මාතලේ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 12/65.

සී. මනෝහරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ඒ. ගුණරත්න මහතා 1970 ජූලි මස 28 දින සිට 30 දින දක්වා සහ 1970 අගෝස්තු මස 3 දින කළුතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 11/64.

එස්. ජේ. ඩී. ද එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. ජේ. පීරිස් මහතා 1970 ජූලි මස 24 දින සිට 26 දින දක්වා බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 28/63.

කේ. වී. ස්වර්ණාධිපති මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. ඕ. එම්. තාහිර් මහතා 1970 ජූලි 19 දින කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/63.

සී. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එම්. විජේසූරිය මහතා 1970 ජූලි මස 15 දින හෝමාගම ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/අයි. 1/51.

සී. වී. උඩලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එල්. එන්. වික්‍රමසිංහ මහතා 1970 ජූලි මස 26 දින ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 26/61.

ජේ. සේනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එල්. එන්. වික්‍රමසිංහ මහතා 1970 ජූලි මස 27 වැනි දින සිට 31 දින දක්වා ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 16/69.

එම්. බී. ජී. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. සිමම්පිල්ලේ මහතා 1970 අගෝස්තු මස 9 සිට 11 දින දක්වා මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 16/69.

එම්. බී. ජී. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. වී. සේනාතිරාජා මහතා 1970 අගෝස්තු මස 4 දින සිට 8 දින දක්වා මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 35/67.

එච්. ඩබ්ලිව්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ටී. එස්. බූල් මහතා 1970 ජූලි මස 21 දින හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඕ. 17/55.

එන්. දේවේන්ද්‍ර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. සිවගුරුනාදන් මහතා 1970 ජූලි මස 22 දින කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී.10/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එල්. ද සිල්වා මහතා 1970 ජූලි මස 26 වැනි දින බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 30/66.

ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩී. සේරසිංහ මහතා 1970 ජූලි මස 24 දින සිට 29 දින දක්වා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 14/65.

ඒ. එල්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1970 ජූලි මස 24 සහ 25 දින ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/65.

ඩී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. මතවරාජා මහතා 1970 ජූලි මස 31 දින සිට අගෝස්තු මස 4 දින දක්වා ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ත්‍රිකුණාමලයේ ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 29/66.

ආර්. එල්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. ජේ. වී. කුරේ මහතා 1970 ජූලි 24 දින කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ 12/65.

ටී. එන්. අබේවීර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. චින්නයියා මහතා 1970 ජූලි මස 23 දින සිට 27 දින දක්වා කල්මුනේ ක්‍රියා කරන මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එච්. 2/57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ජී. පණ්ඩිතසේකර මහතා 1970 ජූලි 28 දින සිට 30 දක්වා හලාවත සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : පීඑල්./එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එම්. අබුතහිර් මහතා 1970 ජූලි මස 27 වැනි දින සිට 30 දින දක්වා මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්./එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. වී. සේනාධිරාජා මහතා 1970 ජූලි මස 25 වැනි දින සිට 26 වැනි දින දක්වා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/ඩී. 11/63.

ජී. එච්. ජී. එෆ්. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩබ්ලිව්. ඕ. ද සිල්වා මහතා 1970 ජූලි මස 27 වැනි දින ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. ඩී. පී. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. ඒ. ඊ. පින්තු මහතා 1970 ජූලි මස 16 වැනි දින පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු හා කඩවත් සත්පිටිය, රාජවන්නි සහ කුමාරවන්නි පළාත, ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් සහ පිටිගල් කෝරලේ උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. වී. සේනාධිරාජා මහතා 1970 ජූලි මස 26 වැනි දින වවුනියා සහ මන්නාරම් දිස්ත්‍රික්කයන්හි වවුනියා දකුණු ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 7/64.

අයි. කිරුපාකරන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. රාසයියා මහතා 1970 අගෝස්තු මස 3 වැනි දින සිට 8 වැනි දින දක්වා යාපනය දිස්ත්‍රික්කයේ දිවයින්වල සහ බටහිර වලිකාමම්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ. 38/37.

පී. එන්. ප්‍රේමරත්න මහතා 1970 අගෝස්තු මස 22 වැනි දින සිට කුලියාපිටිය ගම්බද උසාවියේ අංක 10779 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරි සහ දේවමැදි හත් පත්තු ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 8/64.

එස්. කඩවතආරච්චි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. සූරියආරච්චි මහතා 1970 ජූලි මස 17 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරිය සහ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එම්. අබුතහිර් මහතා 1970 ජූලි මස 28 වැනි දින මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරමේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/47/57.

එස්. පී. පී. ජයතිලක මහතා 1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට බිබිල ගම්බද උසාවියේ අංක බී/සී. 1709 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස බින්තැන්න සහ බුත්තල අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 3/59.

ජී. නුගවෙල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ඊ. ඉලංගන්තිලක මහතා 1970 අගෝස්තු මස 6 වැනි දින සහ 7 වැනි දින මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර සහ උඩ දුම්බර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 7/59.

එස්. ධර්මදාස මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. කුමාරගේ මහතා 1970 ජූලි මස 15 වැනි දින අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ පහත බුලත්ගම, අටළුගම සහ පනාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ සහ කුරුවිටි කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 7/57.

ඇම්. ඇම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1970 ජූලි මස 31 වැනි දින සහ අගෝස්තු මස 3 වැනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව නිකවැරටිය ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති සහ හිරියාල පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 10/61.

ඩබ්ලිව්. බී. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු. එස්. කරුණාරත්න මහත්මිය 1970 ජූලි මස 27 වැනි දින ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ, බටහිර සියනෑ කෝරලේ (මැද පත්තුව) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ දකුණු අළුත්කුරු කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 ජූලි මස 29 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ.

8-305

---

## වෙනත් පත් කිරීම් ආදිය

**1970 අංක 236**

අංකය : ඊබී/ඒ—258/2.

පහත සඳහන් පත්වීම කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා සතුටුවී ඇත :—

මාතර පාලන දිස්ත්‍රික්කය භාර වැඩ බලන ආණ්ඩුවේ ඒජන්ත ටී. දේවේන්ද්‍ර මහතා 1970 ජූලි මස 6 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව, මාතර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රොල් ඇඳුපණත යටතේ ප්‍රාදේශිය අධිකාරී.

බී. මහාදේව,
ස්ථිර ලේකම්

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
වොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ—7,

1970 ජූලි මස 27 වෙනි දින.

8-487

**1970 අංක 237**

පා. 4/සාවි 33/7, පා 4/සාවි 2/349, පා 4/සාවි 20/26.

## අධිකරණ අමාත්‍යාංශය

### 82 වන වගන්තිය යටතේ දැන්වීම

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජූසේ මරියා ජයමාන්න වන මම,

1. නීතිඥ මොහිදීන් මොහමඩ් හලල්දීන් මහතා අනුරාධපුරය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,
2. බෝඹුවල දේවගේ එන්දෝරිස් ප්‍රනාන්දු මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
3. පැවිලන් සෙබමාලෙයි සින්නදුරෙයි මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

පත් කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 අගෝස්තු 5 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-489

---

# ආණ්ඩුවේ නිවේදන

## මුද්දර ආඥාපනත

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ මුදල් ඇමති විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1970 ජූලි මස 30 දින,
කොළඹදී ය.

### ව්‍යවස්ථාව

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ පනවා 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1970 ජූනි 11 වැනි දින 14,910 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛනයෙහි 76 වැනි විෂයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂය ඇතුළත් කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"77. විශ්ව තැපැල් සංගමයේ මූලස්ථානයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීම සැමරීම පිණිස නිකුත් කළ විශ්ව තැපැල් සංගමයේ නව ගොඩනැගිල්ල පිළිබිඹු කෙරෙන ශත 50 වටිනාකමින් යුක්තවූ තැපැල් හා ආදායම් මුද්දර.

78. විශ්ව තැපැල් සංගමයේ මූලස්ථානයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීම සැමරීම පිණිස නිකුත් කළ විශ්ව තැපැල් සංගමයේ නව ගොඩනැගිල්ල පිළිබිඹු කෙරෙන රුපියල් 1 ශත 10 වටිනාකමින් යුක්ත වූ තැපැල් හා ආදායම් මුද්දර.

79. කොළඹ වෛද්‍ය විද්‍යාලීය සියවස සැමරීම පිණිස නිකුත් කළ විද්‍යාව පිළිබඳ සම්ප්‍රදායානුකූල සංකේතය වන පොල් තෙල් පහන සහ වෛද්‍ය වෘත්තියේ සංකේතය වන යෂ්ටිය පිළිබිඹු කෙරෙන ශත 05 වටිනාකමින් යුක්තවූ තැපැල් සහ ආදායම් මුද්දර.

80. කොළඹ වෛද්‍ය විද්‍යාලීය සියවස සැමරීම පිණිස නිකුත් කළ විද්‍යාව පිළිබඳ සම්ප්‍රදායානුකූල සංකේතය වන පොල්තෙල් පහන සහ වෛද්‍ය වෘත්තියේ සංකේතය වන යෂ්ටිය පිළිබිඹු කෙරෙන ශත 45 වටිනාකමින් යුක්තවූ තැපැල් සහ ආදායම් මුද්දර."

8-309

## තැපැල් කාර්යාලීය ආඥාපනත

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාලීය ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ තැපැල් සහ විදුලි සංදේශ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1970 ජූලි 29 වෙනි දින,
කොළඹ දී ය.

### ව්‍යවස්ථාව

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාලීය ආඥා පනතේ 16 වැනි වගන්තිය යටතේ පනවා 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1970 ජූනි 11 වැනි දින 14,910 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛනයෙහි 77 වැනි විෂයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂය ඇතුලත් කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"78. විශ්ව තැපැල් සංගම් මූලස්ථානයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීම සැමරීම පිණිස නිකුත් කළ විශ්ව තැපැල් සංගමයේ නව ගොඩනැගිල්ල පිළිබිඹු කෙරෙන ශත 50 වටිනා කමින් යුක්තවූ තැපැල් හා ආදායම් මුද්දර.

79. විශ්ව තැපැල් සංගම් මූලස්ථානයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීම සැමරීම පිණිස නිකුත් කළ විශ්ව තැපැල් සංගමයේ නව ගොඩනැගිල්ල පිළිබිඹු කෙරෙන රු. 1 ශත 10 වටිනාකමින් යුක්තවූ තැපැල් හා ආදායම් මුද්දර.

80. කොළඹ වෛද්‍ය විද්‍යාලීය සියවස සැමරීම පිණිස නිකුත් කළ විද්‍යාව පිළිබඳ සම්ප්‍රදායානුකූල සංකේතය වන පොල්තෙල් පහන සහ වෛද්‍ය වෘත්තියේ සංකේතය වන යෂ්ටිය පිළිබිඹු කෙරෙන ශත 05 වටිනාකමින් යුක්තවූ තැපැල් හා ආදායම් මුද්දර.

81. කොළඹ වෛද්‍ය විද්‍යාලීය සියවස සැමරීම පිණිස නිකුත් කළ විද්‍යාව පිළිබඳ සම්ප්‍රදායානුකූල සංකේතය වන පොල්තෙල් පහන සහ වෛද්‍ය වෘත්තියේ සංකේතය වන යෂ්ටිය පිළිබිඹු කෙරෙන ශත 45 වටිනාකමින් යුක්තවූ තැපැල් සහ ආදායම් මුද්දර."

8-299

---

එල්.ඩී.—බී. 97/41. පිඑන්. 1880.

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි 5 වැනි දින දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයෙහි 51 වැනි ගවන්තිය යටතේ කෙරෙන නිවේදනයයි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970 ජූලි මස 28 වැනි දින,
කොළඹ දීය.

### නිවේදනය

කලින් කල සංශෝධිත 1934 පෙබරවාරි 5 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයයන්හි 48ක වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය අන්තර්ගත කිරීමෙන්, මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

"48 ග. ලංකා විදේශ සේවයේ තමා දරන තනතුර විශ්‍රාම වැටුප් සහිතයයි තමා එම තනතුර දරමින් සිටියදීම ප්‍රකාශයට පත් කරනු ලැබුවාවූ ද, වයසින් පනස් පස්වැනි වියට නොඑළඹියාවූ ද ලංකා විදේශ සේවයේ I වැනි හෝ II වැනි ශ්‍රේණියේ කිසියම් රජයේ සේවකයෙකුට 1970 අගෝස්තු 15 වැනි දින හෝ ඊට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යථා පරිදි දෙන ලද ලිඛිත දැනුම් දීමක් මගින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමැතිවිය හැකි අතර, ඔහුගේ එම විශ්‍රාම ගැනීම ක්‍රියාත්මක වීමේදී, තනතුර අහෝසි කිරීම හේතුකොට ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබීනම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7 වැනි වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබිය හැකිවූ ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කළ හැකිය.

8-308

අංකය : 543 ඊ/141 කී (vii කොටස)

මෙහි පහත නියමිත තනතුර දරන්නා එම තනතුරට පත් කරනු ලැබූ දින සිට විශ්‍රාම වැටුප්වලට සුදුසුකම් ඇත්තකු බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර සහ එම ව්‍යවස්ථාවල විධිවිධානයන්ට යටත්ව මෙයින් දන්වනු ලැබේ.

විදේශ බාහිර කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

ලංකා විදේශ සේවයේ 1 වැනි ශ්‍රේණියේ තනතුරු 1 යි.

(ජී. ඇස්. පීරිස් මහතා විසින් උසුලන තෙක්)

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජූලි 28 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ.

8-306

---

## පඩි පාලක සභා ආඥපනත

### නිවේදනයයි

ටයර් හා ටියුබ් සෑදීම, ටයර් නැවත පිරවීම ඇතුළු රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට පඩිපාලක සභා ආඥපනතේ 9 (4) (ආ) වගන්තිය යටතේ එකී පඩිපාලක සභාවෙන් ඉවත් කරනු ලැබූ ඇල්ප්‍රඩ් විජේසූරිය මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් චාර්ල්ස් විජේසූරිය මහතා පත් කරන ලද බව වෂී 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්වරයා.

1970 අගෝස්තු මස 3 වැනි දින,
කොළඹ දීය.

8-316

---

### නිවේදනයයි

**1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනත**

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥපනතේ 33 වන වගන්තිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970. 3. 26

#### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය : ආතවුලුන්දාව වැව—අයි/6 (5.15×8.60).

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ සවභාවය :

පෞද්ගලික ඉඩම් : දළ වශයෙන් අක්කර 200 යි.
රජයේ ඉඩම් : නැත.

3. එකඟවූ කොන්දේසි නම් :

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම්—

(අ) වැව් බැම්ම උස්සා සෑදීම.
(ආ) සොරොව් තුනක් ඉදිකිරීම.
(ඇ) පාලකයක් ඉදිකිරීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 1,30,000 දක්වා නැතිම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථොක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරු වල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත් තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස දුවු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන් ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

8-329/1

---

### නිවේදනයයි

**1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනත**

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥපනතේ 33 වන වගන්තිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970. 3. 26

#### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය : සුරවිල වැව—අයි/6 (5.80×8.05).
2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ සවභාවය :

පෞද්ගලික ඉඩම් : දළ වශයෙන් අක්කර 150 යි.
රජයේ ඉඩම් : නැත.

3. එකඟවූ කොන්දේසි නම් :

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම්—

(අ) වැව් බැම්ම සෑදීම.
(ආ) සොරොව් හතරක් සෑදීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 1,15,000 දක්වා නැතිම රජය විසින් භාර ගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථොක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරු වල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන් හෝ අඳ ගොවියන් නොමැත් තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන් ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

8-329/2

---

### නිවේදනයයි

**1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනත**

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥපනතේ 33 වන වගන්තිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා

සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970. 3. 26

## සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය: මයියාව වැව—අසි/6 (6.05× 7.15).

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය:

පෞද්ගලික ඉඩම්: දළ වශයෙන් අක්කර 150 යි.
රජයේ ඉඩම්: නැත.

3. එකඟවූ කොන්දේසි නම්:

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම්—

(අ) වැව් බැම්ම සෑදීම.
(ආ) සොරොව් හතරක් සෑදීම.
(ඇ) ඇඳහැලෙන වර්ගයේ වානයක් සෑදීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 1,40,000 දක්වා තැනීම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අයකරනු ලැබේ.

8-329/3

---

## නිවේදනයයි

### 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970. 3. 26

## සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය: තිනිපිටිගම-මරක්කළගම කරදිය වැලැක්වීමේ ව්‍යාපාරය—අසි/11 (6.90×1.30)

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය:

පෞද්ගලික ඉඩම්: දළ වශයෙන් අක්කර 205.
රජයේ ඉඩම්: නැත.

3. එකඟවූ කොන්දේසි නම්:

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම්—

(අ) බැම්ම සෑදීම.
(ආ) කවුළු දෙකකින් යුත් පාලකයන් අටක් ඉදිකිරීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 1,40,000 දක්වා තැනීම රජය විසින් භාර ගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

8-329/4

---

## 1966 අංක 37 දරණ ලංකා ගුවන් විදුලි ප්‍රචාරක නීතිගත සංස්ථා පනත

1966 අංක 37 දරණ ලංකා ගුවන් විදුලි ප්‍රචාරක නීතිගත සංස්ථා පනතේ අංක 45(1) වැනි වගන්තිය යටතේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිවරයා විසින් පනවන ලද රෙගුලාසි.

ආර්. ඇස්. පෙරේරා,
ප්‍රවෘත්ති සහ ගුවන් විදුලි ඇමති.

1970 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දීය.

### රෙගුලාසි

1. මෙම රෙගුලාසි ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (උපදේශක කාරක සභා) 1970 රෙගුලාසි ලෙස හැඳින්විය යුතුය.

2. (අ) (3) වැනි ඡේදයේ සඳහන් වන ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු සම්බන්ධ සංස්ථාවට උපදෙස් දීම සඳහා සංස්ථාව අවශ්‍ය යයි සලකන උපදේශක සභා වුවමනා ප්‍රමාණයක් සංස්ථාව මගින් සංස්ථාපනය කළ හැකිය.

(ආ) (1) වැනි ඡේදය යටතේ සංස්ථාපනය කරනු ලබන උපදේශක කාරක සභා, මින්පසු මෙම රෙගුලාසිවල "අනුශාසක කාරක සභාව" ලෙස හැඳින්වෙයි.

(ඇ) උපලේඛනයේ සඳහන් විෂයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් හෝ වරින් වර තීරණය කෙරෙන එවැනි වෙනත් කරුණු හෝ ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාව විසින් එක් එක් අනුකාරක සභාව වෙත පැවරිය යුතුය.

(ඈ) එක් එක් අනුශාසක කාරක සභාවේ සභාපති වශයෙන්, එම අනුශාසක කාරක සභාවේ සාමාජිකයෙකු සංස්ථාව මගින් පත් කළ යුතු ය.

(ඉ) යම්කිසි ආගමික කටයුත්තක් සම්බන්ධයෙන් පත් කෙරෙන අනුශාසක කාරක සභාවක් හැර සෑම අනුශාසක කාරක සභාවක්ම සාමාජිකයින් 6 දෙනෙකුට නොවැඩි ගණනකින් සමන්විත විය යුතු අතර ඔවුන් අතරින් හතර දෙනෙකුට නොවැඩි ගණනක් සංස්ථාව මගින් ද, දෙදෙනෙකුට නොවැඩි ගණනක් ඇමතිවරයා විසින් ද පත් කළ යුතු ය.

(ඊ) ආගමික කටයුතු සම්බන්ධයෙන් පත් කෙරෙන සෑම උපදේශක කාරක සභාවක්ම සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් හතර දෙනෙකුට නොවැඩි ගණනක් ඇමතිවරයා විසින් ද, හය දෙනෙකුට නොවැඩි ගණනක් සංස්ථාව මගින් ද පත් කළ යුතු ය.

(උ) සෑම අනුශාසක සභාවක්ම යටත් පිරිසෙයින් තෙමසකට වරක් වත් රැස් විය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන කෙනෙකු රැස්වීම්වලට සහභාගිවී එහි ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතුය.

(ඌ) පනත යටතේ වන සියලු බලතල හා කාර්ය නියමයන් ක්‍රියාවට පරිවර්තනය කිරීමේදී ඕනෑම කරුණක් නියමිත අනුශාසක කාරක සභාව වෙත සිය අභිමතය පරිදි උපදෙස් සඳහා ඉදිරිපත් කිරීමට සංස්ථාවට හැකි වන්නේ ය.

3. (අ) ගුවන් විදුලි ප්‍රචාරයට සම්බන්ධ සියලුම කරුණු සම්බන්ධයෙන් පොදුවේ උපදෙස් දීම සඳහා, සංස්ථාවේ සියලුම උපදේශක කාරක සභා සභාපතිවරුන්ගේ ද, ඇමතිවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකුගෙන් ද සමන් විත ප්‍රධාන අනුශාසක කාරක සභාවක් සංස්ථාව විසින් පිහිටුවිය යුතුය.

(ආ) (1) වැනි ඡේදය යටතේ පිහිටුවනු ලබන උපදේශක සභාව මෙම රෙගුලාසිවල හැඳින්වෙන්නේ "ප්‍රධාන අනුශාසක කාරක සභාව" යනුවෙනි.

(ඇ) ඇමතිවරයාගේ අනුමතිය ද ඇතිව ප්‍රධාන අනුශාසක කාරක සභාවේ සාමාජිකයෙකු එහි සභාපති වශයෙන් සංස්ථාව මගින් පත් කළ යුතුය.

(ඉ) ප්‍රධාන අනුශාසක කාරක සභාව සෑම දෙසතියකටම වරක් රැස් විය යුතු අතර එම රැස්වීම්වලට අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකු හෝ සහභාගි විය යුතු ය. ප්‍රධාන අනුශාසක කාරක සභාවේ ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරණ කෙනෙකු කටයුතු කළ යුතු ය.

4. (අ) සංස්ථාව මගින් ප්‍රචාරය කරනු ලබන විවිධ වැඩ සටහන්වල අගය තක්සේරු කිරීමෙහිලා සංස්ථාවට උපකාරී වීම් වස් තමන්ට ප්‍රමාණවත් යයි හැඟියන උපදේශක කාරක සභා පත් කිරීමට සංස්ථාවට හැකිය. එවැනි කාරක සභාවලට ගුවන් විදුලි අසන්නන් අතුරෙන් සංස්ථාව මගින් තීරණය කරනු ලබන සංඛ්‍යාවක් ද පත් කළ හැකිය.

(ආ) (1) වැනි ඡේදය යටතේ පිහිටුවනු ලබන උපදේශක කාරක සභාව, මෙම රෙගුලාසිවලදී "අසන්නන්ගේ අනුමණ්ඩල" යනුවෙන් හැඳින් වේ.

(ඇ) මෙසේ පිහිටුවන ලද එක් එක් මණ්ඩලයට සභාපති කෙනෙකු හා ලේකම් කෙනෙකු බැගින් සංස්ථාව මගින් පත් කළ යුතු ය.

(ඈ) අසන්නන්ගේ අනු මණ්ඩලවල කාර්යයන් හා එම මණ්ඩලවල රැස්වීම්වලදී අනුගමනය කළ යුතු පිළිවෙත් සංස්ථාව විසින් සකස් කළ යුතු ය.

5. එක් එක් අනුශාසක කාරක සභාව හෝ අසන්නන්ගේ අනු මණ්ඩල මගින් හෝ ඒ ඒ කාරක සභාවට හෝ අනු මණ්ඩලයට හෝ පැවරී ඇති කරුණු සම්බන්ධයෙන් සංස්ථාවට උපදෙස් දීම යුතුකම වන්නේ ය.

6. (අ) අනුශාසක කාරක සභාවක, අසන්නන්ගේ අනුමණ්ඩලයක හෝ, ප්‍රධාන අනුශාසක කාරක සභාවක, ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ සෑම සාමාජිකයෙකුම, මිය යෑමෙන් හෝ, ඉල්ලා අස් වීමෙන් හෝ ඉවත්වනු ලැබීමෙන් කලින් සිය ධුරය හිස් නොකළ හොත් මිස අවුරුදු තුනක කාලයකට සිය ධුරය දැරිය යුතු අතර, එම තනතුරට නැවත පත් කිරීමට ද සුදුසු වේ.

සිය රාජකාරි කාලය අවසන් වීමට ප්‍රථම සාමාජිකත්වය අහිමිවුනු කෙනෙකු වෙනුවට පත්වුණු තැනැත්තා, පදවියෙන් අස් කිරීම ඉල්ලා අස්වීම, ඉවත්වීම හෝ මරණය හෝ සිදු නොවී නම්, පසුව පත්වූ අයට කලින් තැනැත්තාට හිමිව තිබුණු සේවා කාලයේ ඉතිරි කොටස අවසන් වනතුරු ඔහු සිය ධුරය දැරිය යුතුය.

(ආ) උපදේශක කාරක සභාවකට අසන්නන්ගේ අනු මණ්ඩලයකට හෝ ප්‍රධාන අනුශාසක කාරක සභාවට පත් කරනු ලබන ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය කිසිම හේතුවක් නොදක්වාම අවලංගු කිරීමට ඇමතිවරයාට හැකි වන්නේ ය.

(ඇ) අනුශාසක කාරක සභාවක සෑම සභාපතිවරයෙකුම, එවැනි කාරක සභාවක සභාපති පදවිය අහෝසි වූ විට ප්‍රධාන අනුශාසක කාරක සභාවේ සාමාජිකත්වය ද අහෝසි වේ.

7. (අ) සියළු අනුශාසක කාරක සභා, අසන්නන්ගේ අනු මණ්ඩල සහ ප්‍රධාන අනුශාසක කාරක සභාවේ තීරණ ගනු ලබන්නේ රැස්වීමට සහභාගි වී සිටින හා ඡන්දය දෙන සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙනි. එහෙත් ඡන්දය සමව ලැබුණ විටෙක සභාපති හෝ රැස්වීමේ මූලසුන දරණ තැනැත්තා විසින් දෙවන ඡන්දය හෝ තීරණ ඡන්දය පාවිච්චි කළ හැකිය.

(ආ) රැස්වීමක ගණපූරණය පහත සඳහන් පරිදි විය යුතුය:—

(i) උපදේශක කාරක සභාවක හෝ අසන්නන්ගේ අනු මණ්ඩලයක නම් එම කාරක සභාවේ හෝ අනු මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකි.

(ii) ප්‍රධාන අනුශාසක කාරක සභාවේ සාමාජිකයින් හත් දෙනෙකි.

8. මෙම රෙගුලාසිවල :—

"පනත" යනුවෙන් හැඳින්වෙන්නේ 1966 අංක 37 දරණ ලංකා ගුවන් විදුලි සංස්ථා පනතය.

"සංස්ථාව" යනුවෙන් හැඳින්වෙන්නේ පනත යටතේ සංස්ථාපිත ලංකා ගුවන් විදුලි සංස්ථාවය.

"අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් හැඳින්වෙන්නේ පනතේ 19 වැනි වගන්තිය යටතේ පත් කළ අධ්‍යක්ෂ ජනරාල්වරයාය.

"ඇමතිවරයා" යනුවෙන් පනතේ සඳහන් අර්ථයම ගැනේ.

## උපලේඛනය

(අ) බෞද්ධ කටයුතු
(ආ) ක්‍රිස්තියානි කටයුතු
(ඇ) හින්දු කටයුතු
(ඈ) මුස්ලිම් කටයුතු
(ඉ) පාඨශාලා අධ්‍යාපනය
(ඊ) වැඩිහිටි අධ්‍යාපනය
(උ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු සිංහල වාචික වැඩ සටහන්
(ඌ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු ද්‍රවිඩ වාචික වැඩ සටහන්
(එ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු ඉංග්‍රීසි වාචික වැඩසටහන්
(ඒ) සිංහල සංගීතය
(ඔ) ද්‍රවිඩ සංගීතය
(ඕ) ඉංග්‍රීසි සංගීතය
(ක) විද්‍යාව හා කර්මාන්ත සහ වෛද්‍ය විද්‍යාව
(ග) කෘෂිකර්මය සහ ග්‍රාමීය කටයුතු
(ජ) තරුණ පක්ෂය පිළිබඳ කටයුතු
(ට) වනිතාවන්
(ඩ) වෙළඳ සේවය
(න) වෙළඳ දැන්වීම්
(ත) ලෝක කටයුතු සහ ප්‍රවෘත්ති
(ද) ජාතික එකමුතුව.

8-491

## 1954 අංක 12 දරණ කිරි මණ්ඩල පනත—නිවේදනය

1957 අංක 9 සහ 1964 අංක 18 දරණ පනත්වලින් සංශෝධිත පරිදි 1954 අංක 12 දරණ කිරි මණ්ඩල පනතේ 4 (1) වැනි වගන්තිය යටතේ ගරු කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා විසින් 1970 ජූලි මස 24 වෙනි දින සිට කිරි මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ඇම්. වී. අලහකෝන් මහතා පත් කර ඇති බැව් පොදු දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ටී. එම්. සිල්වා,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970.8.5 දින,
කොළඹ 2,
වැක්ෂෝල් වීදියේ,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ දී ය.

8-418

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### අයිතිය ප්‍රතික්ෂේප කිරීමේ—දැනුම්දීම

1963 අංක 5 දරණ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 28 දරණ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනතේ 34 වැනි වගන්තියේ අංක 1 දරන උප වගන්තිය යටතේ 1962 අප්‍රේල් මස 26 වන දිනැති අංක 13,035 දරණ ගැසට් පත්‍රයේ 16 වන කොටසින් ප්‍රසිද්ධ කර විස්තර කරන ලද්දාවූ ද, පහත දැක්වෙන උපලේඛනයෙන් වඩාත් විස්තර කරන ලද්දාවූ ද දේපල, ඉහතකී පනතේ 34 වගන්තිය යටතේ දැනුම් දෙන ලද දේපල වශයෙන් ප්‍රකාශ කර ඇති අතර ;

ගරු ඇමතිතුමා විසින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් බලයලත් නිලධාරියකු වශයෙන් පත් කරන ලද, ලවන බණ්ඩාර් මදුරාවේ වන මම ඉහත සඳහන් කරන ලද පනතේ 34 වැනි වගන්තියේ 4 වන උපවගන්තියේ විධිවිධාන යටතේ මෙයි දැක්වෙන උපලේඛනයේ විස්තර කරන ලද දේපල සංස්ථාවේ කාර්යයන් සඳහා අනවශ්‍ය හෙයින් එකී ඉල්ලීම මෙයින් ප්‍රතික්ෂේප කර සිටිමි.

ලවන බී. මදුරාවේ,
සාමාන්‍යාධිකාරී,
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.

1970. 8. 6,
කොළඹ.

## උපලේඛනය

මැද පලාතේ, නුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර වීදියේ පිහිටි, යටිනුවර වීදියේ වරිපනම් අංක 16 දරණ, උතුරට වරිපනම් අංක 18 දරණ මෙම ඉඩමෙන් ද, නැගෙනහිරට වරිපනම් අංක 12 හා 16 දරණ ස්ථානයේ ඉතිරි කොටසින් ද, දකුණට වරිපනම් අංක 10 දරණ ස්ථානයෙන් හා බස්නාහිරට යටිනුවර වීදියෙන් මායිම් වූ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඈම්. පෙරේරා විසින් සම්පාදිත, 59. 2. 1 දින අංක 476 දරණ සැලැස්මේ ප්‍රකාර, ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් දහයයි දශම පහයි හතරක් (අ. 0, රූ. 0, පර්. 10.54) වූද, සම්පූර්ණ බිම් කොටස.

(ෂෙල්—නුවර—බ්‍රවුන්රිග් වීදිය)

(එල්ඒ/බී/126)
8-468

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පැවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි පදවිගම්පල ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ව සිට එම ධුරයෙන් ඉවත් කරන ලද හේවාදිවෙල, නත්තඹුර පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ රන්බණ්ඩා මහතා වෙනුවට, රඹුක්කන, යටගම, විල්ගම පදිංචි අතාලදගෙදර පිකිරි බණ්ඩා මහතා, එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී, එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ජූලි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-297/1

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) හා 4 (3) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ පදවිගම්පල ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සභාපති හේවාදිවෙල, නත්තඹුර පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ රන්බණ්ඩා මහතා තිලයෙන් හා සාමාජිකත්වයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ජූලි මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-297/2

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මැදසියපත්තු ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සභාපති, උකුවෙල, මානබොඩ පදිංචි වෙ. එල්. ඈම්. ඉබ්‍රාහිම් ආලිම් සාහිබ් මහතා තිලයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ජූලි මස 30 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශය.

8-296/1

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පැවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි මාතලේ මැදසිය පත්තු ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපතිව සිට එම ධුරයෙන් ඉවත් කරන ලද, උකුවෙල, මානබොඩ පදිංචි වෙ. එල්. ඈම්. ඉබ්‍රාහිම් ආලිම් සාහිබ් මහතා වෙනුවට, උකුවෙල, මාරුකොන පදිංචි ෂරීෆ්දීන් ආරච්චිගේ අබ්දුල් ජලීල් මහතා, එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී, එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ජූලි මස 30 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-296/2

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම; මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මැදසියපත්තු ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ පහත සඳහන් සාමාජිකයින් තිලයෙන් ඉවත් කරමි :—

(1) උකුවෙල, මානබොඩ පදිංචි වෙ. එල්. ඒම්. ඉබ්‍රාහිම් ආලිම් සාහිබ් මහතා,
(2) උකුවෙල, පරගහවෙල පදිංචි එස්. ඈම්. නාහිර්දීන් මහතා,
(3) උකුවෙල, බෝවත්ත පදිංචි කහවත්ත මුදියන්සේලා කිරි බණ්ඩා මහතා,
(4) උකුවෙල, බෝවත්ත පදිංචි විල්ලෝර් මුදියන්සේලා ඩිංගිරි බණ්ඩා මහතා,
(5) උකුවෙල, රයිතලාවෙල පදිංචි සායිබු මුහම්මදු හනීෆා මහතා,
(6) උකුවෙල, මාබේරිය පදිංචි ඈම්. රාජා මරික්කාර් මහතා,
(7) උකුවෙල, ගුරුලවෙල පදිංචි ගගේගෙදර විමලදාස මහතා,
(8) උකුවෙල, නාගපිටිය පදිංචි අප්පුකුට්ටි ආරච්චිගේ කොර්නේලිස් මහතා,
(9) උකුවෙල, කලල්පිටිය පදිංචි කේ. ඈම්. ඩී. විජයදාස මහතා.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ජූලි මස 30 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-296/3

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4(3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර පලාත් ආණ්ඩු සභා ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සභාපති කළුතර උතුර, ගංගාරාම මාවතෙහි පදිංචි තෙල්ගේ ස්ටීවන් පීරිස් මහතා තිලයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 4 වැනි දින.
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-345/1

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි කළුතර පළාත් ආණ්ඩු සහ ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපතිව සිට එම තිලයෙන් ඉවත් කරන ලද කළුතර උතුර, ගංගාරාම මාවතෙහි පදිංචි තෙල්ගේ ස්ටීවන් පීරිස් මහතා වෙනුවට කළුතර, කටුකුරුන්ද, ගාලු පාර, අංක 1281 හි පදිංචි කල්‍යාණදාස ජයසිංහ මහතා එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී එම සභාවේ සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 4 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

8-345/2

---

අංකය : සී/අයි. 597

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47හි, සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය හා මොරටුවේ වෙලෝනා හි, සීමාසහිත ලංකා වීවිං මිල්ස් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක XV වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 අගෝස්තු මස 4 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47හි සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය

සහ

මොරටුවේ වෙලෝනාහි, සීමාසහිත ලංකා වීවිං මිල්ස්

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමයේ සාමාජිකයන් වන පහත නම් සඳහන් සේවකයන්ට සීමාසහිත ලංකා වීවිං මිල්ස්හි පාලක පක්ෂය විසින් වැඩනොදීම යුක්ති සහගතද යන්නත් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් වේ :—

1. විමලසිරි විජේරත්න
2. එච්. බැසිල් නෝනිස්
3. එච්. ඩී. ඇල්බට් ජයතිලක
4. ටී. ගාබ්‍රියෙල්
5. සියුක් ප්‍රනාන්දු
6. ඩී. ආරියපාල
7. ලයනල් ප්‍රනාන්දු
8. ඩබ්ලිව්. සෝමදාස
9. මාහිලාල් පීරිස්
10. ආර්. එස්. වික්‍රමසූරිය
11. එම්. ඩබ්ලිව්. ජයසේකර
12. එච්. ඒ. ජයවීර
13. එන්. සෝමදාස
14. සිරිල් ප්‍රනාන්දු
15. පියසිරි පීරිස්
16. සෝමා ඇරනියගල
17. වේසින් වීරසිංහ
18. ටී. ටී. ෂෙල්ටන් පීරිස්
19. ඩබ්ලිව්. මහින්දරත්න
20. දයා මාලනී
21. ඩී. එම්. සෝමලතා
22. පී. සීලවතී
23. යසපාල
24. දයානන්ද

1970 අගෝස්තු මස 3 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්. ඇල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

8-321

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල (නැවත සකස් කළ පිටු පිළිබඳ) පරිච්ඡෙදය

### අංක 120 දරණ ආඥපනත

මෙහි පහත උපලේඛනයෙහි, එකී දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම සහ තුන්වෙනි තීරුවේ සඳහන් ඔප්පුවලට අදල පළමු වැනි තීරුවේ දැක්වෙන දනට කැඩී බිඳී ගොස් ඇති, ඉඩම් ලියාපදිංචි කළ පොතේ පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව්, ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (පරිච්ඡෙද අංක 120 දරණ) ආඥපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

වර්ෂ 1970 අගෝස්තු මස 17 වෙනි දින සිට 1970 අගෝස්තු මස 30 වෙනි දින දක්වා සතියේ (පෙර පොහෝ දිනවල හැර) රාජකාරි කරන දිනවල පෙරවරු 10 සිට පස්වරු 4 දක්වාද පෙර පෝය දිනවල පෙරවරු 10 සිට දවල් 12 දක්වාද ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂාකර බැලිය හැක.

එම තාවකාලික පිටුවේ කිසියම් සටහනක් පිළිබඳව හෝ එවැනි සටහනක අඩංගු යම් කරුනක් පිළිබඳව හෝ විරුද්ධතාවයක් ප්‍රකාශ කර සිටීමට කැමැති අයෙකු විසින් හෝ යම්කිසි සටහනක් හෝ යම්කිසි සටහනකින් අත්හැර දමන ලද කරුනක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමැති අයෙකු විසින් හෝ එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම පහත අත්සන් කළ අයට ලියවිල්ලකින් දන්වා සිටිය යුතුයි. එම ලියවිල්ල වර්ෂ 1970 සැප්තැම්බර් මස 16 වෙනි දිනට පෙර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයට ලැබෙන ලෙස එවිය යුතුයි. එය ලියාපදිංචි කළ තැපෑලෙන් එවන්නේ නම් යෙහෙකි. විරුද්ධතාවය හෝ ඉල්ලීම සම්බන්ධව විස්තර පැහැදිලි ලෙසත් සම්පූර්ණ ලෙසත් එකී ලියවිල්ලේ අඩංගු විය යුතුය. එම විරුද්ධතාවය හෝ ඉල්ලීම තහවුරු කිරීමට ආධාර වන සියලුම ලියවිලිද එම ලියවිල්ල සමඟ එවිය යුතුය.

රො. සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයය,
කොළඹ 1,
1970 ජූලි මස 30 දින දීය.

උපලේඛනය

| 1 | 2 | 3 |
|---|---|---|
| ඉඩම් ලියාපදිංචි කළ පොතේ කැඩී බිඳී ඇති පිටුව පිළිබඳ විස්තර | පත් ඉරුව අනුව ඉඩමේ විස්තර | ලියාපදිංචි කිරීමේ ඔප්පුවල විස්තර |
| ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කරන කාර්යාලයේ "බී" අක්ෂරය දරණ කොට්ඨාශයේ 10 වෙනි වෙළුමේ 30 වෙනි පත්ඉරුව | නැගෙණහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුවේ අනියතිව හි පිහිටා තිබෙන අක්කර 4 යි රූඩ් 0 පර්චස් 33 ක් විශාලත්වය ඇති ඒ 238 පිඹුරු කඩඉසියේ අංක 1 දරණ කර්තලාගෙර යන ඉඩමට මායිම් :—<br>උතුරට : අංක 198998 පිඹුරු කඩඉසියේ තිබෙන ඉඩමද,<br>නැගෙණහිර : අංක 226326. පිඹුරු කඩඉසියේ තිබෙන ඉඩමේ ඉතුරු කොටසද,<br>දකුණට : අංක 5339 මූලික ප්ලෑනේ අංක 1 දරණ කොටස සහ රජයට අයිති මුඩුකුරියාපුමද,<br>බස්නාහිරට : රජයට අයිති මුඩුකුරියාපුමද වේ. | නොතාරිස් කෙනෙකු සහතික නොකළ 1938.8.2 දින දරණ ලියවිල්ල |

8–440

---

## ගවයන් හංවඩු ගැසීම—ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කම්පලගමුව ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1958 අංක 29 දරණ සත්ව පනත යටතේ පනවන ලද 1962.11.29 වැනි දින ලංකාණ්ඩුවේ අංක 13,406 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ රෙගුලාසි වල II වැනි කොටසේ 12 (iii) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ ගවයන් හංවඩු ගැසීමේ වැඩ පිළිවෙල මෙහි පහත පළ කරමි.

ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස 30 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්‍යාලයේ දීය.

ප්‍රා. ආ. නි. කොට්ඨාශය : කම්පලගමුව

| ග්‍රා.සේ. කොට්ඨාශ අංක | ග්‍රාම සේවක කොට්ඨාශයේ නම | හංවඩු ගසන ස්ථානය | දිනය |
|---|---|---|---|
| 228 ඒ | කඹලගමුව දකුණ | නයන්මතිඩල් | 8.8.70 |
| | එම | මුල්ලියඩි | 10.8.70 |
| | එම | වන්නියනෙයිමඩු | 14.8.70 |
| | එම | 4 වැනි ඇල යුනිට් 8 මුල්ලිපොතාන | 15.8.70 |
| | එම | කයම්වඩි | 17.8.70 |
| | එම | පරවිපන්චන් | 18.8.70 |
| | එම | ජනපද නිලධාරීන්ගේ කාර්‍යාල භූමිය | 20.8.70 |
| 228 | කඹලගමුව උතුර | සිප්පිතිඩල් | 8.8.70 |
| | එම | ගො.ස. භූමිය ග්‍රා.සේ. ගේ කාර්‍යාලය | 10.8.70 |
| | එම | පඩ්මේදු ග්‍රා. ස. ස. භූමිය | 12.8.70 |
| | එම | කොවිල් කුඩියිරිප්පු ග්‍රා.ස.ස. භූමිය | 14.8.70 |
| | එම | ප්‍රා.ආ.නි. කාර්‍යාලය භූමිය | 16.8.70 |
| | එම | ජ. නිලධාරීගේ කාර්‍යාල භූමිය | 17.8.70 |
| | එම | එම | 20.8.70 |
| | එම | පුතුකුඩියිරිප්පු ග්‍රා.සං.ස. භූමිය | 22.8.70 |

8–295

---

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානයේ ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව රොබට් සමරසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.—

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 981 | 1970 ජූලි 2 | දේව සභාව, කොල්ලුපිටිය (ඇසෙම්බ්ලි ඔෆ් ගෝඩ්, කොල්ලුපිටිය) | අංක 1, අල්විස් පෙදෙස, කොල්ලු පිටිය, කොළඹ | ගරු කෝල්ටන් සැමුවෙල් වික්‍රමරත්න | ලංකා දේව සභාව (ඒකාබද්ධ) (ඇසෙම්බ්ලිස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (ඉන්කෝ) |

රොබට් සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්‍යාලය,
කොළඹ, 1970 ජූලි 2 දින දීය.

8–442

## සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)

**277 (5) වගන්තිය යටතේ සැෆයර් එන්ටර්ප්‍රයිසස් ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම**

සමාගම් ආඥා පනතේ (145 වැනි අධිකාරය) විධිවිධාන යටතේ 1965 ජූලි 7 දින සංස්ථාපිත සමාගමක් වන සැෆයර් එන්ටර්ප්‍රයිසස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් එදින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, සැෆයර් එන්ටර්ප්‍රයිසස් ලිමිටඩ් නම රෙජිස්ටරයෙන් කපා හරින බවට, 1968.4.18 දින අංක 14,798 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන්, 1968.4.1 දින දරණ දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සැෆයර් එන්ටර්ප්‍රයිසස් ලිමිටඩ් ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, සැෆයර් එන්ටර්ප්‍රයිසස් ලිමිටඩ් නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බවද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බවද, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් ජයරත්නම් ෆිලික්ස් පොන්නම්බලම් වන මම සමාගම් ආඥා පනතේ (145 වැනි අධිකාරය) 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ජේ. එෆ්. පොන්නම්බලම්,
සමාගම් රෙජිස්ට්‍රාර්.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1970 ජූලි මස 26 වෙනි දින.

8-340

---

## සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)

**277 (5) වගන්තිය යටතේ වූඅරිස්ට් ඉන්ස් ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම**

සමාගම් ආඥාපනතේ (145 වැනි අධිකාරය) විධිවිධාන යටතේ 1966 මාර්තු මස 11 දින සංස්ථාපිත සමාගමක් වන වූඅරිස්ට් ඉන්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, එ දින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, වූඅරිස්ට් ඉන්ස් ලිමිටඩ් නම රෙජිස්ටරයෙන් කපා හරින බවට, 1970. 4. 24 දින අංක 14,903 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන්, 1970. 4. 8 දින දරණ දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

වූඅරිස්ට් ඉන්ස් ලිමිටඩ් ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, වූඅරිස්ට් ඉන්ස් ලිමිටඩ් නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බවද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බවද, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් ජයරත්නම් ෆිලික්ස් පොන්නම්බලම් වන මම සමාගම් ආඥාපනතේ (145 වැනි අධිකාරය) 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ජේ. එෆ්. පොන්නම්බලම්,
සමාගම් රෙජිස්ට්‍රාර්.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1970 අගෝස්තු මස 3 දින.

8-465

---

## වන්දනා ගමන් ආඥාපනත

**වෙල්ලස්ස කොටබෝව දේවාලයේ 1970 ඇසළ උත්සවය**

යථෝක්ත උත්සවය 1970 අගෝස්තු මස 3 වැනි දින ආරම්භවී, 1970 අගෝස්තු මස 19 වැනි දින දක්වා පැවැත්වෙන බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1964.7.24 වැනි දින අංක 14,117 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි කෙරෙහි මහජනයාගේ විශේෂ අවධානය මෙයින් යොමු කරවමි.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස 23 වැනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

8-307

---

## විශ්ව තැපැල් සංගමයේ නව මූලස්ථාන ගොඩනැගිල්ල විවෘත කිරීම සඳහා මුද්දර විශේෂයෙන් නිකුත් කිරීම

විශ්ව තැපැල් නව මූලස්ථාන ගොඩනැගිල්ල විවෘත කිරීම සඳහා 1970 අගෝස්තු 14 දින ශත 50 සහ රු. 1 ශත 10 වටිනාකමින් යුත් මුද්දර විශේෂයෙන් නිකුත් කරනු ලබන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි. මෙම මුද්දර 1970 පෙබරවාරි 28 දින තෙක් හෝ තොග අවසානය වන දිනය යන මේ දෙදිනෙන් කලින් එළඹෙන දිනය දක්වා අලෙවිය සඳහා පාවිච්චි ලැබේ. මෙම කාලය තුළ දී දැනට අලෙවියෙහි පවත්නා කාණ්ඩයේ ශත 50 වටිනාකමින් යුත් මුද්දර අලෙවි කිරීම අත්හිටවනු ලැබේ.

2. ශත 50 සහ රු. 1 ශත 10 වටිනාකමින් යුක්ත වූ මුද්දර විශ්ව තැපැල් සංගමයේ නව මූලස්ථාන ගොඩනැගිල්ල පිළිබිඹු කෙරේ.

ස. සිවටම්පලම්,
දේශීය ආදායම් කොමසාරිස්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1970 අගෝස්තු 7 වැනි දින.

8-505

---

## ජලභීතිකා රෝගය පිළිබඳ ප්‍රකාශනය

උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ එරුක්කලම්පිඩ්ඩි ගම්සභා සීමාව තුල සහ මුසලි ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මුරුන්කන් ගම්සභා සීමාව තුල පිස්සු බලු රෝග අන්තරා පැතිර ඇති හෙයින්, එම ප්‍රදේශ තුල පෞද්ගලික ගොඩනැගිල්ලක, මිදුලක හෝ වත්තක හැර, පොදු ස්ථානයක හෝ පාරක බල්ලකු බැඳ තබාගෙන හෝ දක්කාගෙන යමින් නොසිටින අවස්ථාවක වහාම විනාශ කරණු ලබන බව ජලභීතිකා රෝග ආඥා පනතේ (476 පරිච්ඡේදය) II වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1970 අගෝස්තු මස 20 වැනි දින සිට 1971 පෙබරවාරි 20 දින දක්වා වලංගු වේ.

එස්. තතිර්කාමනාතන්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස
මන්නාරම දිසාපති කාර්යාලයේ දී ය.

8-312

---

මගේ අංකය : සීකේ/ආර්බී/14.

## පිස්සු බලු උවදුර

කොළඹ දිස්ත්‍රික්කයේ ගම්බද පෙදෙස්වල පිස්සු බලු උවදුර පවතින බව මට එත්තු ගොස් තිබෙන නිසා, එම දිස්ත්‍රික්කයේ කොළඹ, දෙහිවල-ගල්කිස්ස සහ මීගමුව යන මහනගර සභා සීමාවලින් ද, අවිස්සාවේල්ල, ගම්පහ, ජාඇල, කොලොන්නාව, කෝට්ටේ, මොරටුව, වත්තල මාබෝලේ සහ පෑලියගොඩ යන පළාත් ආණ්ඩු සභා සීමාවලින් ද, බත්තරමුල්ල, කොටිකාවත්ත, කැළණිය, හැඳල, කඩාන, මුල්ලේරියාව, මහරගම, හෝමාගම, දළුගම, පිළියන්දල, රාගම, මීරිගම, වේයන්ගොඩ, මිනුවන්ගොඩ හා කොච්චිකඩේ යන සුළු නගර සභා සීමාවලින් ද පිටත පිහිටි කොළඹ දිස්ත්‍රික්කයට අයත් සියළුම ප්‍රදේශ පිස්සු බලු උවදුර පවතින හෝ පැවතීමට ඉඩ ඇති ප්‍රදේශ ලෙස පිස්සු බලු ආඥාපනතේ (476 වැනි පරිච්ඡේදයේ) II වැනි වගන්තිය යටතේ 1970 අගෝස්තු මස 1 වැනි දින සිට මෙයින් ප්‍රකාශයට පත් කරමි.

2. කොළඹ දිස්ත්‍රික්කයේ යථෝක්ත ප්‍රදේශය තුළ පුද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ඉඩමක හැර ප්‍රසිද්ධ ස්ථානයකදී හමුවන, පටියකින් බැඳ හෝ කෙනෙකු විසින් ගෙන යනු නොලබන ඕනෑම බල්ලකු දුටු වහාම මරා දැමීමට ඉඩ තිබේ.

ඩ. වි. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස
කොළඹ,
දිසාපති කාර්යාලයේ දීය.

8-317

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

උතුරු දුම්රිය මාර්ගයේ වැල්ලව සහ ගනේවත්ත දුම්රිය ස්ථාන අතර දුම්රිය සැතපුම් 64, දම්වැල් 69.28 හි කුරුණෑගල හිරිපිටිය මහා මාර්ගය වැටී ඇති ස්ථානයේ පිහිටි දුම්රිය හරස් පාර අලුත්වැඩියා කරනු ලබන හෙයින් 1970.8.22 වෙනි සෙනසුරාදා පස්වරු 7 සිට පස්වරු 11.30 දක්වා සහ 1970.8.23 වැනි ඉරිදා පෙරවරු 4.00 සිට පස්වරු 6 දක්වා අර්ධ වශයෙන් ද, 1970.8.22 වෙනි සෙනසුරාදා පස්වරු 11.30 සිට 1970.8.23 වෙනි ඉරිදා පෙරවරු 4 දක්වා සම්පූර්ණයෙන් ද රථ වාහන ගමනාගමනයට වසා තබනු ලැබේ. මෙම කාලය තුළදී රථවාහන ගමනාගමනය කුරුණෑගල, වාරියපොල, ගනේවත්ත පාරවල් හරහා වෙනස් කරනු ලැබේ.

ජේ. පෝල් සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

8-320

---

## තොග ගණන් ගැනීම හා වාර්ෂික හරි වැරදි බැලීම සඳහා රජයේ බෙහෙත් ගබඩාව වැසීම

වර්‍ෂ 1970 සැප්තැම්බර් මස 1 වෙනි දින සිට වර්‍ෂ 1970 සැප්තැම්බර් මස 30 වන දින දක්වා (දෙදිනම ඇතුලුව) තොග ගණන් ගැනීම් හා වාර්ෂික හරි වැරදි බැලීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවෙන් ඖෂධ සැපයීම නවත්වනු ලැබේ.

ලේ දියර, බැක්ටීරියා නිවාරක ද්‍රව්‍ය (ඇන්ටිබයටික්ස්), කිරි ආහාර, ඖෂධීය වායු වර්ග, අබිං මිශ්‍රණයන් වැනි අත්‍යවශ්‍ය හදිසි ඖෂධයන් හැර වෙන කිසිත් ඖෂධයක් සඳහා මෙම කාලපරිච්ඡේදය තුල දී අයදුම් පත් භාර නොගන්නා බව දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආරෝග්‍යශාලා හා බෙහෙත් ශාලා භාර නිලධාරීන් සහ වත්තු පාලකයන් වෙත මෙයින් දැනුම් දෙමි.

ඩී. ඒ. ඒ. මුණසිංහ,
රජයේ බෙහෙත් ගබඩා අධිකාරි.

1970 ජූලි මස 29 දින,
කොළඹ සීන්ස් පාරේ අංක 355,
රජයේ බෙහෙත් ගබඩාවේ කාර්යාලයේදීය.

8-346

---

## ප්‍රකාශනයයි

යාපනය දිස්ත්‍රික්කයේ තෙන්මරාච්චි ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් කයිතඩි ප්‍රදේශයේ පිස්සු බලු උවදුර පවතින බැව් මට ඒත්තු ගොස් තිබෙන නිසා, එම කයිතඩි ගම්සහ ප්‍රදේශයේ සීමාවට අයත් සියලුම ප්‍රදේශ පිස්සු බලු උවදුර පවතින හෝ පැතිරීමට ඉඩ ඇති ප්‍රදේශ ලෙස මෙම ගැසට් නිවේදනය පලවූදා සිට මාස 6 ක කාලයක් යනතුරු පිස්සු බලු ආඥාපණතේ (476 වන පරිච්ඡේදයේ) II වන වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරමි.

2. ප්‍රකාශයට පත් කරන ලද යථෝක්ත ප්‍රදේශය තුල, පුද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ඉඩමක හැර ප්‍රසිද්ධ ස්ථානයකදී, පාරකදී හෝ වෙනයම් ස්ථානයකදී හමුවන, පටියකින් හෝ කෙනෙකු විසින් ගෙන යනු නොලබන ඕනෑම බල්ලකු දුටු වහාම මරා දැමීමට ඉඩ තිබේ.

ජේ. එම්. සබාරත්නම්,
වැඩබලන දිසාපති,
යාපනය දිස්ත්‍රික්කය.

කච්චේරිය,
යාපනය, 1970.7.29

8-315

---

## "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම

ඇල්.ඩී.බී—16/37
සු.කො/එල් බී/ඊ/5

### සුරාබදු ආඥාපනත

#### අංක 579 දරන සුරාබදු නිවේදනය

1956 ඔක්තෝබර් මස 26 වැනි දින අංක 10,984 දරන ගැසට් පත්‍රයේ පළවූ අංක 459 දරණ සුරාබදු නිවේදනය මගින් සංශෝධනය කරන ලද 1955 මැයි මස 5 වැනි දින අංක 10,793 දරණ ගැසට් පත්‍රයේ පළවූ අංක 449 දරණ සුරාබදු නිවේදනය 1970 ජූලි 1 වැනි දින සිට එහිවූ 11 වැනි උපලේඛනයේ දැක්වෙන සුරාබදු ඒ.ඊ. 1 දරන ආකෘති පත්‍රය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් තවදුරටත් සංශෝධනය වියයුතු යයි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් නියෝග කර ඇත :—

(අ) 6 වැනි කොන්දේසිය 7 වැනි කොන්දේසිය ලෙස නැවත අංක යෙදීමෙන් සහ

(ආ) 5 වැනි කොන්දේසියට ඉක්බිතිවම පහත දැක්වෙන කොන්දේසිය ඇතුලත් කිරීමෙන්,

"6. පරිපාක කළ, රසවත් කළ, මිශ්‍ර කළ සහ වර්ණවත් කළ සියලු අරක්කු සුරාබදු කොමසාරිස් විසින් තීරණය කරන පරිදි ලන්ඩන් ඌණ සම්මත අංශක 20 සහ ලන්ඩන් ඌණ සම්මත අංශක 35 අතර වූ මත්සැර ප්‍රමාණයක විය යුතුය".

එම්. රාජේන්ද්‍ර,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජූලි මස 27 දින,
කොළඹ දීය.

8-314

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

## උපලේඛනය

## 1970

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි